www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජවිපෙ ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡාවලට එරෙහි සිය උද්ඝෝෂනය උත්සන්න කරයි

## The JVP intensifies its campaign against Sri Lankan peace talks

**විජේ ඩයස් විසිනි**
**2004 අගෝස්තු 31**

ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ශ්‍රී ලංකාවේ ජන වාර්ගික ආතතීන් ඉහල දැමීමේ උද්ඝෝෂනයක කොටසක් ලෙස "සැබෑ සාමයේ සතුරෝ කවුරුද?" යන මැයෙන් දිවයින පුරා දේශන මාලාවක් පවත්වා ගෙන යයි. තමන් සාමයට කැමති වන බව ජවිපෙ කියා පාන නමුදු මෙම දේශනවල -- මෙයින් එක් දේශනයක් අගෝස්තු 17 දා කොළඹ දී පැවැත්වින -- සමස්ත තල්ලුව ම පවත්නේ රට යලිත් යුද්ධයට ඇද දැමීමට යි.

අප්‍රේල් මහ මැතිවරනය ජය ගැනීමෙන් පසුව ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ ඇගේ සුලුතර එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ඇන හිට ඇති සාම සාකච්ඡා යලි ඇරඹීමට අඩමාන උත්සාහයක යෙදී ඇත. කෙසේ වෙතත්, අන්තර්-වාර ස්වයං-පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) සඳහා තමන් ඉදිරිපත් කර ඇති යෝජනා මත ම පැවැත්විය යුතු ය යි එල්ටීටීඊය අවධාරනය කරන සාකච්ඡාවලට එරෙහිව එජනිසයේ ප්‍රධාන හවුල්කරුවකු වන ජවිපෙ උද්ඝෝෂනයක යෙදී සිටී.

එල්ටීටීඊයත් කරුනා නමින් ද ප්‍රසිද්ධ වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් එයින් බිඳී ගිය නැගෙනහිර පලාතේ කන්ඩායමකුත් අතර සිදු වන ඝාතන හා පලි ගැනීම් මාලාවක් මධ්‍යයේ "සාම ක්‍රියා දාමය" යලි ඇරඹීමට නෝර්වේජියානු අතරමැදියන් දැරූ උත්සාහයන් ව්‍යර්ථ වී තිබේ. එල්ටීටීඊයට වල කැපීමේ උපක්‍රමයක් ලෙස කරුනාගේ සටන්කරුවන්ට සහාය දීමට මිලිටරිය මැදිහත් වීම පිලිබඳ සාක්ෂ්‍ය වඩ වඩා ඉස්මත්තට පැමිනෙයි. මෙම සන්දර්භය තුල ජවිපෙ උද්ඝෝෂනය සන්නද්ධ හමුදාවල වඩාත් ම යුද උද්ඝෝෂක කොටස් සමග පෙල ගැසෙයි.

ජවිපෙ විටින් විට තමන් "සමාජවාදීන්" හා මාක්ස්වාදීන් වන්නේ ය යි සාවද්‍ය ලෙස කියා පාන නමුදු එය ඍජුව ම ප්‍රකාශයට පත් කරන්නේ ධනපති රාජ්‍යයේ අවශ්‍යතාවන් ය. ප්‍රථම වතාවට පාලක සභාගයේ කොටස්කරුවකු බවට පත්ව ඇති ජවිපෙ තම මැතිවරන පොරොන්දු කඩ කිරීම සහ ජීවන මට්ටම් අඛන්ඩව නරක අතට හැරීම අරබයා වැඩෙන මහජන වෛරයකට මුහුන දී සිටී. "සාම ක්‍රියා දාමයට" එරෙහි ඔවුන්ගේ උද්ඝෝෂනයේ එල්ලය වන්නේ මෙම නැගෙන අපේක්ෂා භංගත්වය හා වෛරය සිංහල ස්වෝත්තමවාදී දේශපාලනයේ භයානක ආවෘත අන්තය දෙසට අපසරනය කිරීම යි.

ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ කොලඹ තරුන සේවා සභා මධ්‍යස්ථානයෙහි සංවිධානය කොට තිබූ දේශනය පැවැත්වී ය. ඔහු සිය දේශනය ආරම්භ කලේ සාම සාකච්ඡා ඉල්ලා සිටින සියල්ලන් ම එල්ටීටීඊයේ ආවතේවකාරයන් යැයි වාචාල ලෙස හෙලා දකිමිනි. 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුම අත්සන් කල පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව "කොල කොටින්" යැයි ඔහු හංවඩු ගැසී ය -- එජාපෙ නිල වර්නය කොල පැහැය යි. නෝර්වේරියානු පහසුකම් සලසන්නන් "සුදු කොටින්" යැයි ඔහු පැවසී ය. සාකච්ඡා ඉල්ලා සිටින විවිධ ආන්ඩු නො වන සංවිධාන "ඩොලර් කාක්කන්" යැයි ඔහු චෝදනා කලේ ය.

යලි යුද්ධයට යා යුතු ය යි විශේෂයෙන් ඉල්ලා සිටියේ නැති නමුදු සාමය පිලිබඳව කෙරෙන අවධාරනයන්ට පහර දෙමින් වීරවංශ පැවසුවේ ඒවා එල්ටීටීඊයේ පීඩනයට යටත් වීමේ ප්‍රතිඵල බව යි. "මව් බිම රැකීම" අන් සියලු ඉල්ලීම්වලට ඉහලින් තැබිය යුතු අතර සාමය දෙවන තැනට වැටිය යුතු ය යි ඔහු කී ය. රට ආරක්ෂා කිරීම ගැන සැලකූ කල ආන්ඩුවේ පැවැත්ම පවා දෙවන තැනට වැටිය යුතු ය යි වීරවංශ ප්‍රකාශ කලේ ය. මෙය ඔහුගේ එජනිස සගයන්ට කෙරුනු අනතුරු ඇඟවීමක් ලෙස මිස අන් අයුරකින් අර්ථ දැක්විය නො හැකි ය. "මෙම ඊනියා සාම ක්‍රියා දාමය පරාජය කිරීම සඳහා මහජනතාව බලමුලු ගැන්වීමේ" අවශ්‍යතාව අවධාරනය කරමින් ඔහු මෙසේ කියා සිටියේ ය: "අපේ සියලු ප්‍රයත්නවල දී මව් බිමේ ආරක්ෂාව මුදුනින් ම තැබිය යුතු යි."

වීරවංශ පන්ති පදනමක සිට "සාම ක්‍රියා දාමයට" පහර නො දුන් අතර විරැකියාවේ හා දරිද්‍රතාවේ නැගීමට තුඩු දෙන ආර්ථික ප්‍රතිව්‍යුහකරන න්‍යාය පත්‍රයකට සටන් විරාමය සමීපව බැඳී පවතී ය යන කාරනාව පෙන්වා දුන්නේ ද නැත. "සාම ක්‍රියා දාමයට" ජවිපෙ දක්වන විරුද්ධත්වය මුලුමනින් ම ප්‍රතිගාමී වන අතර එය පාදක වී ඇත්තේ සිංහල බෞද්ධ ආධිපත්‍යය ආරක්ෂා කිරීම මත ය. සාමාන්‍ය වැඩ කරන

ජනතාවගේ අවශ්‍යතා ප්‍රකාශයට පත් කරනු වෙනුවට ජවිපෙ පිලිබිඹු කරන්නේ එල්ටීටීඊය සමග ඇති කර ගැනෙන කිසි යම් බලය බෙදා ගැනීමේ සාම සම්මුතියකින් තමන්ගේ අවශ්‍යතා අනතුරට ලක් වෙතැයි යන්න පිලිබඳව ගැඹුරින් ම උත්සුක වී සිටින පාලක ප්‍රභූවේ කොටස්වල -- මිලිටරියේ හා රාජ්‍ය යන්ත්‍රයේ, බෞද්ධ ධුරාවලියේ හා කර්මාන්තකරුවන් අතර වඩා පසුගාමී කොටස්වල -- ආස්ථානය යි.

වීරවංශ අන්තර්-වාර ස්වයං-පාලන අධිකාරියක් පිලිබඳ එල්ටීටීඊයේ යෝජනා ද ඒ අර්ථයෙන් ම හෙලා දැක්කේ ය -- එම සැලසුම ස්වභාවයෙන් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී හා වර්ගෝත්තමවාදී වීම නිසා නො ව එය "ඒකීය රාජ්‍යයට" එනම් දෙමල විරෝධී වෙනස්කම් කිරීම මත පදනම් වූ වත්මන් ධනපති රාජ්‍යයට වල කපන බැවිනි. එල්ටීටීඊය වෙන ම දෙමල රාජ්‍ය කැබලිත්තක් සඳහා වූ සිය ඉල්ලීම ආකාරගත ලෙස අත හැර ඇති නමුදු වීරවංශ මෙසේ ප්‍රකාශ කලේ ය: "අයිඑස්ජීඒය වෙන ම දෙමල ඊලමක් මිස අනෙකක් නෙවෙයි. බඩ ගින්නේ ඉඳ ගෙන හරි අපි අපේ මව් බිමේ ඒකීය භාවය ආරක්ෂා කරනවා."

අයිඑස්ජීඒය පිහිටුවීම සම්බන්ධයෙන් එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමට යන්නේ නම් තමන් ආන්ඩුවෙන් හේද වන බවට ජවිපෙ කර ඇති තර්ජනය වීරවංශ පුනරුච්චාරනය කලේ ය. "එජනිස ස්ථාවරය එහි ගිවිස ගත් වැඩ පිලිවෙලෙහි පැහැදිලිව සඳහන් කර තියෙනවා. එනම් ගැටලුවට අවසන් විසඳුමක් සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම යි. එවන් විසඳුමක් සඳහා කාල නියමයන් තීන්දු කලාට පසුව පමනකි අන්තර්-වාර පාලනයක් පිහිටුවීමේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කල යුත්තේ. . . . මෙම ස්ථාවරය වෙනස් කිරීමට අපි ඉඩ දෙන්නේ නැහැ." යි ඔහු ගුගුලේ ය.

වීරවංශ දන්නා පරිදි "අන්තර්-වාර පාලනයක්" "අවසන් විසඳුමකට" ගැට ගැසීම එල්ටීටීඊයට පිලිගත නො හැකි කරුනකි. 2002 සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමේ පටන් මේ දක්වා සහන මාලාවක් ම දී ඇතත් එල්ටීටීඊය තමන්ගේ ම සාමාජිකත්වය තුලත් පැරනි යුද ප්‍රදේශවල දුෂ්කර කොන්දේසිවලට අඛන්ඩව මුහුන දෙන දෙමල මහජනතාව අතරත් වැඩෙන අසන්තෘප්තියට මුහුන දෙමින් සිටියි. අයිඑස්ජීඒ යෝජනාවට එක හෙලා ම විරුද්ධ වීම මගින් ජවිපෙ තථ්‍ය වසයෙන් කරන්නේ මොන යම් හෝ සාම සාකච්ඡාවක් කඩාකප්පල් කිරීම යි.

පැවති එජාපෙ ආන්ඩුව මිලිටරියට වල කපා රට පාවා දී ඇතැයි වීරවංශ චෝදනා කලේ ය. "ශ්‍රී ලංකා හමුදාවේ වීරෝදාර මිලිටරි ප්‍රහාර හේතුවෙන් 2001 වන විට එල්ටීටීඊය දුර්වල බලවේගයක් බවට පත්ව තිබුනා. එල්ටීටීඊයට ශ්‍රී ලංකා රාජ්‍යය දේශපාලනිකව පරාජය කරන්ට හැකි වූයේ රනිල් වික්‍රමසිංහගේ එජාපෙ අත්සන් කරපු සටන් විරාම ගිවිසුම යටතේ" යැයි ඔහු පැවසී ය.

ඉතිහාසය යලි ලිවීමකට සම වන මෙම ප්‍රකාශ ඉලක්ක කොට ඇත්තේ දේශපාලනඥයන් යුද ප්‍රයත්නයට වල කපා ඇතැයි නිරන්තරයෙන් පැමිනිලි කරන මිලිටරියේ ඉහල කොටස්වලට ආයාචන කරනු පිනිස ය. ඇත්ත වසයෙන් ම ගත් කල 2000 අප්‍රේල්-මැයි කාලයේ දී එල්ටීටීඊය ප්‍රධාන අලිමංකඩ කඳවුර අල්ලා ගෙන උතුරේ යාපන අර්ධද්වීපයේ විශාල ප්‍රදේශයක් ඉක්මනින් ම සියතට ගත් කල ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවට තමන් එතෙක් මුහුන දුන් දරුනු ම පසුබෑමක් අත්විඳීමට සිදු විය. ඔවුන්ගේ ආක්‍රමනය නතර කරන ලෙසට එල්ටීටීඊය මත ජාත්‍යන්තර පීඩනය එල්ල වූ තතු තුල 40,000ක පමන ශ්‍රී ලංකා භටයෝ තියුනු සටනකින් පසුව අල්ලා ගෙන සිටීමට සමත් වූහ.

මෙම අන්ත පරාජය කොලඹ පාලනය තුල දරුනු දේශපාලන අර්බුදයක් අවුලුවා ලූයේ කුමාරතුංගගේ පොදු පෙරමුනු ආන්ඩුවට හදිසියේ මිලිටරි උපකරන මිල දී ගැනීමටත් ඒ අවස්ථාවේ ම සාම සාකච්ඡා සඳහා පදනම දමනු පිනිස ව්‍යවස්ථාමය වෙනස්කම් පිලිබඳ යෝජනා ඉදිරියට ඇඹීමටත් බල කරමිනි. ජවිපෙ එක්සත් ජාතික පක්ෂය (එජාපෙ ප්‍රධාන කොටස්කරු) සමග එක්ව නව ව්‍යවස්ථාව ජාතිය පාවා දීමක් ලෙස හෙලා දැක එම ව්‍යවස්ථාමය වෙනස්කම් ගෙන ඒම වලකා ලී ය. ආර්ථිකය එක දිගට කඩා වැටෙමින් පැවති තතු තුල යුද්ධය නතර කරන විසඳුමක් සොයා ගන්නා ලෙස මහ ව්‍යාපාරිකයන් වෙතින් පොදු පෙරමුන හා එජාපය යන දෙපාර්ශ්වය මත ම පීඩනය එල්ල විය. කුමාරතුංග එය ඉටු කිරීමෙහි ලා අසමත් බව ඔප්පු වූ කල ඇගේ ආන්ඩුව බිඳ වැටුනේ 2001 දෙසැම්බරයේ අලුත් මැතිවරනයකට පාර කපමිනි. එජාපෙ එම මැතිවරනයෙන් ජය ගත්තේ ය.

"ශ්‍රී ලංකා හමුදාවේ වීරෝදාර මිලිටරි ප්‍රහාර" අගය කිරීම මගින් ජවිපෙ සෘජුව ම පෙල ගැසී ඇත්තේ ආරම්භයේ පටන් ම 2002 සටන් විරාමයට විරුද්ධ වූ සන්නද්ධ හමුදා නායකත්වයේ කොටස් සමග ය. මිලිටරිය කුමාරතුංග සමග සහයෝගීව මහ මුහුදේ දී ප්‍රකෝපකාරී ක්‍රියාවන් මාලාවක් ම සංවිධානය කල අතර ඒවායේ ප්‍රතිඵලය වූයේ සාම සාකච්ඡාවලට වල කැපීම යි. පසුව එය 2003 නොවැම්බරයේ දී ආරක්ෂක අමාත්‍යාංශය ඇතුලු අමාත්‍යාංශ තුනක් පවරා ගනිමින් ඇය සිදු කල ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවට ද පිටුබලය සැපයී ය. කුමාරතුංග ජවිපෙ සමග එක්සත් ජනතා නිදහස් සන්ධානය තැනීමෙන් පසුව පෙබරවාරියේ දී පාර්ලිමේන්තුව හිතුවක්කාරී ලෙස විසුරුවා හැර අප්‍රේල් මැතිවරනය සඳහා පාර කැපුවා ය.

දැන් ප්‍රථම වතාවට ආන්ඩු බලයේ සිටින ජනතා විමුක්ති පෙරමුනේ ජනතාවාදී වාචාල කතා ඉක්මනින් ම එලිදරව් වෙමින් පවතී. ආන්ඩුව සිය "රට පෙරට" වැඩ පිලිවෙලට කැප වී ගත යුතු ය යි ජවිපෙ කෙදිරිලි ප්‍රකාශ නිකුත් කරන නමුත් එජනිසයේ එකදු මැතිවරන පොරොන්දුවක් වත් -- රාජ්‍ය අංශයේ සේවකයන්ට

සියයට 70ක වැටුප් වැඩි වීමක්, සහනාධාර යලි ලබා දීම, ජීවන වියදම අඩු කිරීම සහ පුද්ගලීකරනය නතර කිරීම -- ඉටු කර නැත.

"සාම ක්‍රියා දාමයට" එරෙහි ජවිපෙ උද්ඝෝෂනය කුමාරතුංග සහ එජනිස ආන්ඩුව මුහුන දෙන මූලික උභතෝකෝටිකය අවධාරනය කරයි. දරුනු මූල්‍ය අර්බුදයකට මුහුන දී සිටින තතු යටතේ ජාත්‍යන්තර ආධාර හා සහාය ලබා ගැනුමට මාවත විවර කර ගනු පිනිස ජනාධිපතිනිය සාම සාකච්ඡා යලි ඇරඹීමක් ඉල්ලා සිටියා ය. කෙසේ වෙතත් මේ සමග ම ඇයට ජවිපෙන් පමනක් නො ව මිලිටරි ධුරාවලියෙන් හා සිංහල ස්වෝත්තමවාදයේ ගැඹුරින් ම ගිලී සිටින ඇගේ ම ශ්‍රීලනිපය තුලින් ද එල්ල වන විරුද්ධත්වයට මුහුන දීමට සිදුව ඇත.

කුමාරතුංග ජවිපෙන් ඈත් වී ගැනීම පිනිස එජනිසයේ නිල නායකත්වයෙන් ඉල්ලා අස් වූවා ය. එහෙත් ඇය ඒ වෙනුවට පත් කල හිටපු අගමැතිවරයකු හා වත්මන් නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා වන රත්නසිරි වික්‍රමනායක දැඩි මතධාරී සිංහල ස්වෝත්තමවාදියකු ලෙස ප්‍රසිද්ධ ය. කුමාරතුංග ලන්ඩනයේ පෞද්ගලික චාරිකාවක යෙදී සිටිද්දී ඔහු අගෝස්තු 23 දා යාපනයේ දී මිලිටරි නිලධාරීන් හමුවේ යුදවාදී කතාවක් කරමින්, ස්වකීයමය පාලන පද්ධතීන් පිහිටුවීම සම්බන්ධයෙන් එල්ටීටීඊය හෙලා දැක ස්කැන්ඩිනේවියානු සාම නිරීක්ෂකයන් එල්ටීටීඊයට හිතපක්ෂපාතී ය යි ද චෝදනා කලේ ය. ඉන් දින දෙකක් ඇවෑමෙන් නාවික අන දෙන නිලධාරීන් අමතා ඔහු කියා සිටියේ "අපේ ඉවසීමට සීමාවක්" තිබෙන බව යි. "(නැගෙනහිර පලාතේ) මෙම ඝාතන අපි කොච්චර කාලයක් ඉවස ගෙන ඉන්න ද" යි ඔහු මොර දුන්නේ ය.

එදින ම යුද හමුදාපති ශාන්ත කෝට්ටෙගොඩ මාධ්‍යවලට මෙසේ පැවසී යː "එල්ටීටීඊ කේඩර සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් අපේ සොල්දාදුවන්ට පහර දෙනව. මේ තත්වෙ දිගට ම යන්න ඉඩ දෙන්න පුලුවන්කමක් අපට නැහැ. මම නැගෙනහිර මිලිටරි අන දෙන නිලධාරීන්ට අන දීල තියෙනව ආරක්ෂාව පිනිස තමන්ගෙ උපරිම ශක්තිය පාවිච්චි කරන්න කියල." එල්ටීටීඊයට එරෙහි කරුනා කන්ඩායමේ ප්‍රහාරවලට රහසේ සහයෝගය දීමෙන් පසුව සන්නද්ධ හමුදාවෝ මිලිටරි මෙහෙයුම් යලි ඇරඹීමේ කඩතුරාවක් ලෙස එල්ටීටීඊයේ ප්‍රතිප්‍රහාර යොදා ගනිති.

යුද්ධය කරා ආපසු යාමක් ජනගහනයේ අතිමහත් බහුතරයක -- සිංහල, දෙමල හා මුස්ලිම් යන සියලු ම කොටස්වල -- විරෝධයට ගැඹුරින් ම ලක් වනු ඇත. දශක දෙකක යුද්ධය තුල දී 60,000කට අධික ජන සංඛ්‍යාවක් මිය ගිය අතර ඊටත් වඩා වැඩි ප්‍රමානයක් අංග විකල තත්වයට හෝ උන් හිටි තැන් අහිමි වීමට ලක් වූහ. "මව් බිම ආරක්ෂා කිරීම" අන් සියල්ලට ම ඉහලින් තැබිය යුතු ය යි ඉල්ලා සිටින කල ජවිපෙ අනතුරු අඟවන්නේ යුද්ධයට එරෙහි මොන යම් හෝ විරුද්ධත්වයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අතිදරුනු ම විධික්‍රම යොදා ගැනීමට තමන් සූදානම් බව යි. 1980 ගනන් අග දී "මව් බිම පලමුව" තැබීමේ නාමයෙන් ජවිපෙ කම්කරු පන්තික සටන්කාමීන් හා දේශපාලන විරුද්ධවාදීන් සිය ගනනක් ඝාතනය කල බව කිසිවෙකුත් අමතක නො කල යුතු ය.

© www.wsws.org